රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 325


රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07,
1986 මාර්තු මස 20 වන දින.


සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානයන් සහ
රාජ්‍ය සංස්ථා ප්‍රධානයන් වෙත.

## ලිපිකරු හා සමාන්තර ශ්‍රේණිවල සේවය කරන ඌන සේවා නියුක්ත උපාධිධාරීන්ගේ සංගණනය.

රජයේ සේවයේ හා රාජ්‍ය සංස්ථා අංශයේ ලිපිකරු හා සමාන්තර ශ්‍රේණිවල සේවය කරන ඌන සේවා නියුක්ත උපාධිධාරීන්ගේ දුක් ගැනවිලි පරීක්ෂා කොට සුදුසු යෝජනා ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් ගරු යෞවන කටයුතු හා රැකිරක්ෂා ඇමතිතුමා පත් කර ඇත.

02. එම කමිටුවේ කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු රැස්කර ගැනීම පිණිස රජයේ සේවයේ හා රාජ්‍ය සංස්ථා අංශවල සේවය කරන ඌන සේවා නියුක්ත උපාධිධාරී නිලධාරීන්ගේ සංගණනයක් පැවැත්වීමට එම අමාත්‍යාංශය කටයුතු යොදා තිබේ.

03. එබැවින් ඔබ අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/සංස්ථාව යටතේ සේවය කරන, ආරම්භක ඒකාබද්ධ වැටුප වර්ෂයකට රු: 9420/=ට අඩු වැටුප් ක්‍රම හිමි සේවාවන්ට අයත් හෝ තනතුරු දරන හෝ, උපාධිධාරී නිලධාරීන් පිළිබඳව මෙයට අමුණා ඇති ආකෘතියෙන් විමසා ඇති තොරතුරු, 1986 අප්‍රේල් මස 26 වන දිනට පෙර ලැබෙන සේ කොළඹ 02, පාක් වීදියේ, අංක 48, පාක්වේ ගොඩනැගිල්ලේ, යෞවන රැකියා සැලසුම් අංශයේ, යෞවන රැකියා සැලසුම් අධ්‍යක්ෂ වෙත කරුණාකර ඉදිරිපත් කරන්න.

Siriwardhana

(ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන)
රාජ්‍ය පරිපාලන ලේකම්.

ර/19.

රජයේ සේවයේ හා රාජ්‍ය සංස්ථා අංශයේ ලිපිකරු හා සමාන්තර ශ්‍රේණිවල
සේවය කරන ඌන සේවා නියුක්ත උපාධිධාරීන්ගේ සංගණනය

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 325 හා බැඳේ.

දෙපාර්තමේන්තුව/අමාත්‍යාංශය/සංස්ථාව: *
දිනය:

| අනු අංකය | ඌන සේවා නියුක්ත උපාධිධාරියාගේ නම | අයත් වන සේවය, ශ්‍රේණිය හා දැනට දරණ තනතුර | ආරම්භක වාර්ෂික ඒකාබද්ධ වැටුප | උපාධිය පිළිබඳ විස්තර :- |
|---|---|---|---|---|
| | | | | |

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන:
දිනය:

* අදාල නොවන වචන කපා හරින්න.

:- උපාධියේ නම, විශ්ව විද්‍යාලය, අභ්‍යන්තරද බාහිරද වන වග, උපාධිය සම්මත්වූ වර්ෂය, උපාධි විෂයයන් හා පන්ති සාමාර්ථය සඳහන් කරන්න.